# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/179/2025 (NPC)

**ඒ.එම්.පී.එච්.කේ.අතපත්තු**
**අභියාචක**
**එදිරිව**
**ජාතික පොලිස් කොමිෂන් සභාව**
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.17**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී :-** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

**පෙනී සිටීම :-** අභියාචක සිටී,
අභියාචක පුද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය පෙනී සිටී.

## -**නියෝගය**-

**ඒ.එම්.පී.එච්.කේ.අතපත්තු යන අභියාචක විසින් ඉදිරිපත් කර ඇති, 2025.09.23 දිනැති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇති සහනය පහත සඳහන් වේ.**

"01. **මෙම අභියාචනය භාරගෙන එය විභාගය සඳහා නියම කරන ලෙසත්,**

02. **වැලිවේරිය පොලිස් ස්ථානාධිපති ධූරයෙන් ඉවත් කරන ලද 2020.11.13 දින වන විට පොලිස් ස්ථානාධිපති ධූරයෙන් ඉවත් කිරීම බලාත්මකව පැවති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලැබී නොමැති බවට නියෝගයක් ලබාදෙන ලෙසත්,**

03. **මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් 2020.12.31 දිනැති අංක 02/03/06/04/2020 දරණ ලිපිය මගින් එම ස්ථානමාරුවීම් සඳහා අනුමැතිය ලබාදීම බල රහිත කරන ලෙසත්,**

04. වැලිවේරිය පොලිස් ස්ථානාධිපති ධූරයෙන් ඉවත් කිරීම එවකට බලාත්මකව පැවැති 2009.02.20 දින ප්‍රකාශයට පත්කර ඇති අංක 1589/30 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති කාර්ය පටිපාටික රීති වලට පටහැනිව සිදුකර ඇති බවට නියෝගයක් නිකුත් කරන ලෙසත්,

05. ගරු පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය සුදුසු යැයි සළකන වෙනත් සහනයන් සහ ප්‍රදානයන් ලබා දෙන ලෙසත් ය.”

එහි දෙවන ජේදය මගින් ඉල්ලා ඇත්තේ, වැලිවේරිය පොලිස් ස්ථානාධිපති ධූරයෙන් ඉවත් කිරීමේ තීරණය සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලැබී නොමැති බවට නියෝගයක් ලබා දෙන ලෙසය. ඉහත කී 03 වන ජේදයෙන් ඉල්ලා ඇත්තේ ස්ථානමාරුවීම සඳහා අනුමැතිය ලබාදීම බලරහිත කරන ලෙසය. 04 ජේදය මගින් ඉල්ලා ඇත්තේ, මෙම සිදුවීම සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති ආකාරය කාර්ය පටිපාටික රීති වලට පටහැනි බවට නියෝගයක් නිකුත් කරන ලෙසත්ය. ඉහතකී සියළු ඉල්ලීම් මගින් අභියාචක ඉල්ලා ඇත්තේ කිසියම් තත්ත්වයක් තිබූ බවට ප්‍රකාශයක් (a declaration) ලබාදෙන ලෙසයි.

2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත යටතේ ඇති බලතල මොනවාද යන්න එම පනතේ 06 වන ජේදයේ සඳහන්ව ඇත. එම වගන්තියට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් වාර්තාවක් කැඳවීමට ද, එම ආයතන දෙකට කිසියම් ලේඛන ඉදිරිපත් කරන ලෙසට නියෝග කිරීමට ද, මෙම විනිශ්චය අධිකාරයට බලතල ලැබී ඇත. ඊට අමතරව එම පනතේ 7 වන වගන්තිය යටතේ විනිශ්චය අධිකාරය ගනු ලබන තීරණ, පාර්ශවකරුවන්ට දැනුම් දිය යුතු බවත් සඳහන් වේ. තවද මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ, පනතේ 3 වන වගන්තියෙහි සඳහන් වන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ගනු ලැබූ නියමකට හෝ තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් විභාග කොට විනිශ්චය කිරීමට විනිශ්චය අධිකාරයට බලය ඇති බවයි. පනතේ 4 වන වගන්තියේ සඳහන් වන්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණයන්ගෙන් අතෘප්තියට පත් කවර හෝ රජයේ නිලධාරියෙකුට හෝ පොලිස් නිලධාරියෙකුට, එම තීරණයට එරෙහිව අභියාචනයක්, මෙම විනිශ්චය අධිකාරයට ඉදිරිපත් කිරීමට අවසර ඇති බවයි.

ඉහත කී වගන්තීන් සමූහය එක්ව සළකා බැලීමේ දී පැහැදිලිව පෙනී යන්නේ, මෙම විනිශ්චය අධිකාරය වෙත බලතල ලැබී ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණයක් ස්ථිර කිරීමට, වෙනස් කිරීමට, හෝ වෙනත් ආකාරයකින් සංශෝධනයට ලක්කිරීම සඳහා වන නියෝගයන් නිකුත් කිරීම සඳහා බවයි. ඒ හැරෙන්නට යම් යම් අවස්ථාවන් සම්බන්ධයෙන් ප්‍රකාශනයන් ප්‍රකාශයට පත් කිරීමට, පනතේ විධිවිධාන වලින් මෙම විනිශ්චය අධිකාරය වෙත බලතල පවරා නැත.

ඉහත කරුණු සළකා බලා මෙම අභියාචනය සම්බන්ධයෙන් ඉල්ලා ඇති සහනයන් ලබාදීමට මෙම විනිශ්චය අධිකාරය වෙත බලතල නොමැති බවට තීරණය කරමු.

එම හේතූන් සළකා බලා, ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-